දහදිය වරිගුව

කලා බිස්නස්

ඔස්ට්‍රේලියාව පුරාම විසිරිච්ච එක එක විදිහේ ශ්‍රී ලාංකික සංවිධාන තියෙනවා. විවිධ අරමුණු තිබුණත් හැමෝගෙම උත්සාහය අපේ සමාජයට මොකක් හරි සේවයක් කරන එකනෙ. ඒක හරිම වැදගත්.

ඉතින් පිහිටුවා ගත්තට ඒවා පවත්වාගෙන යන්නත් ඔනෙනෙ. එතනදි තමයි ප්‍රශ්නෙ. මේ සංවිධාන පවත්වාගෙන යන්නත් ඒ සංවිධාන වලින් කෙරෙන සේවා පවත්වාගෙන යන්නත් සල්ලි ඕනෙ. සල්ලි හොයන්නෙ විවිධ ප්‍රසංග මියුසිකල් ෂෝ ෆිල්ම්ස් එහෙම සංවිදානය කරලනෙ. වෙන කොයින් සල්ලි හොයන්නද? අඩුම ගානෙ ආප්ප රාත්‍රියක්වත් නොතිබ්බ නම් කවුරුවත් නිකම් සල්ලි දෙන්නෙ නැහැනෙ.

ඒත් දැං දැං මේ ෂෝ පෙන්නිල්ලට කණ කොකා හඬාගෙන යනවා කියලයි කියන්නෙ. සංවිධාන ගණනාවකම අය දැන් තැන් තැන් වල මේක කතා වෙනවා. පහුගිය කාලයේ මෙල්බන් වල කරනු ෂෝස් ගොඩක් සහ ඉදිරියට කෙරෙන ෂෝස් ගොඩක් සංවිධානය කරලා තියෙන්නෙ එක්තරා කලාකාරයෙක් යයි කියන අයෙක් තමන්ගෙ පුද්ගලික ප්‍රසංග හැටියට. මේ මනුස්සයා එක පාරටම ෂෝස් නවයකටම හෝල්ස් බුක් කරලලු. ඉතින් අර දුප්පත් සමාජ සංවිධාන කරන අය අඬ අඬා ඉන්නවා අපි කොතැනටද අපේ ප්‍රසංගයක් දාන්නෙ කියලා.

ඒත් දොරේලා මට ආරංචි හැටියට නං මේ ෂෝ බිස්නස් එක පිටිපස්සෙ ඉන්නෙ මේ සමාජයේ කැපී පෙනෙන තනතුරක් දරන ප්‍රසිද්ධ පුද්ගලයෙක්ලු. ඒත් එයාගෙන් ඇහුවම කියන්නෙ "අපෝ මං නං නෙවෙයි. මං ඒ කලාකාරයට සල්ලි ටිකක් දුන්නා විතරයි හෝල්ස් බුක් කරන්න" කියලලු.

මේක ඉතින් නිදහස් රටක්කෙ. ඕනෙ කෙනෙකුට තමං කැමති බිස්නස් එකක් කරගෙන ඉන්න කාගෙන් වත් තහනමක් තියෙන එකක්යැ. ඒත් ඉතිං හැංගිලා ඉඳලා බඳල් අත් ඉස්සරහට දාලා මේ කරන වැඩෙන් අපේ සමාජ සංවිධාන වලට වෙන අකටයුත්ත නම් කැතයි රජෝ.

අනෙක් අතට ගල් රෝල දැම්මා වගේ හැම දේම පොඩි පට්ටම් කරගෙන ගිහින් සල්ලි හොයන එකෙන් සමාජයට වෙන අවැඩ ගැනත් පොඩ්ඩක් හිතනවා නම් තමුන්නෙ නායක කමටත් හොඳයි නේද දොරේ.

ලස්සනම හැන්දෑවක්

කාණ්ඩෙට කියන්ඩ මං ඒ තරං සාහිත්‍ය පොරක් නෙවෙයි. ඒත් රත්න ශ්‍රී එනව කිව්වම නොයා ඉන්නෙ කොහොමද? ඒ මනුස්සය ලිව්ව සින්දු කියක් නම් අපි රස විඳිද්ද? ඒ දවස් වල අපේ නංගිගෙ කටේ තිබ්බෙම "තොල් පෙති විතරක් පළමු හාදුවෙන් තෙමන්න" කියන සින්දුවමයි. (එයාට ඒ කාලෙ මොකක් හරි වෙලා කියල අපි තේරුම් ගත්තෙත් ඒ ගායනාවෙන්ම තමයි. ඒත් ඉතින් එහෙම වෙන එක සොබාවිකයිනෙ. කෙල්ලෙක්ගෙ හිතට තරුණ කාලෙ ලව් එකක් එන්නැත්තං එයාට මොකක් හරි ලෙඩක් තියෙනවා)

රත්න ශ්‍රී ගෙ සින්දු ගැන කතා කරන්න තරං ම බහුශ්‍රැතයෙක් කෙවෙයි. ඒත් ඒ සින්දු මට දැනෙනවා කියන එක නං කියන්න මට පුලුවන්. ඒ හින්දමයි රත්න ශ්‍රී වෙනුවෙන් තිබ්බ "ලස්සනම අහස" බලන්න ගියේ. ඒ සුන්දර සැන්දෑවට ගිය එක ගැන මං මේ දැනුත් සතුටු වෙනවා.

සංවිධානය අපූරුයි. මං හෝල් ඒකේ අන්තිම පේළියෙ වාඩි වුණේ මේක හොඳින්ම රස විඳින්නයි. එළ කිරි සහ ජලය. පටන් ගත්ත ගමන්ම වෙනසක් දැනුණා. හැමදාම දකින නිවේදකයන් වෙනුවෙට එතන හිටියෙ කලාකාරයෙක්. මේ වැඩේට ඒ මනුස්සය තරම් සුදුසු මිනිහෙක් නෑ කියල මං දන්නව. ජගත් අයිය පටන් ගත්ත හැටියෙන්ම ඒ සැන්දෑව සුන්දර එකක් වෙන බව මට තේරුණා. වෙල් ඩන් සර්.

කම්මැල්ලව්ර මහත්තයගෙ කතාව ටිකක් දිග වුණත් අපට ගන්න දෙයක් තිබුණ. රත්න ශ්‍රී කියන කලාකාරයට එක් එක් විදිහට අර්ථ දක්වන්න එතුමා ගත් වෙහෙස නියමයි.

තමන්ගෙ ගීත ගැන රත්න ශ්‍රී කළ අදහස් දැක්වීම හරිම රසවත්. සැබෑ කලාකාරියක් යනු මොකක්ද කියල ඔහු අපට තේරුම් ගරපු හැටි මට හිතට වැදුණා නියමෙට. කලාව තුළ බොරුව තියෙන්න බෑ කියල උදාහරණ ඇතුව පෙන්නලා දුන්න එක වටිනවා. අම්මපා බලාගෙන ගියාම අපි නොදැනුවත් කමට මේ තියාගෙන රස විඳින්නෙ කිසිම පදනමක් නැති නිර්මාණ නේද කියලා මට හිතුනා.

ඒ හැන්දෑව වර්ණාවත් කළේ උපුල් ශාන්ත සන්නස්ගල කියන වියත් කථිකයා. කියන්න වචන නෑ. කියන්න තියෙන දේ පපුවට නෙවෙයි බොක්කටම වදින්න කිව්වා. "ගීත රචකයෙකුගෙ නිර්මාණ රස විඳින්න මේ තරම් ජනතාවක් ලංකාවෙදි නම් එකතු වෙන්නෙ නැහැ" කියල කතාව පටන් ගත්තු සන්නස්ගල ලංකාවෙ මිනිස්සුන්ට එහෙම වුණේ ඇයි කියන එක අපූරුවට පැහැදිළි කළා. ඒ එක්කම රත්න ශ්‍රීගෙ වටිනා කම ගැනත් කලාව ගැනත් ව්‍යාජ නිර්මාණ ගැනත් ඔහු දැක්වපු අදහස් ගැන කියන්න වචන නැහැ. උත්සවය අවසානයෙදි එතුමාට ඒ ගැන ස්තුතිකරන්න හිතුවත් හමුවුණේ නැහැ.

මේ වගේ වැඩක් කරන්න කන්න ඕනෙ රැගේ එක ගැන අමුතුවෙන් කියන්න ඕනෙ නැහැ. ඒ නිසා මේක සංවිධානය කරපු තරුණ කලාකාරයන් දෙන්නාත් කලාකාරියත් කළේ නියම වැඩක් දාන්න පහක්.

කුහක සුවරිතවාදය

"ලස්සනම අහස" බලන්න ආව කෙනෙකුට තමන්ගෙ කුහක කම වහගෙන ඉන්න බැරිවෙලා පත්තරයක මඩ ගොඩක් අතුරලා තියෙනවා දැක්කා. මේ මනුස්සයට මේ උත්සවයෙදි අසභ්‍ය දේවල් ඇහුණාලු. අනේ අපට නම් ඇහුණෙ නැහැ.

සන්නස්ගල මහත්තය එයාගෙ අලුත්ම නවකතාව වන "අම්මා" පොතේ මෙහෙම කියලා තියෙනවා.
" මිනිසුන් ලෝකය දිහා බලන්නේ තම තමන්ගේ ඇබ්බැහිකම් වලින්ය"

මිනිස්සු අහන්නෙ කියන දේ නෙවෙයි තමන්ට අහන්න ඕනෙ දේ කියලා කියනවනෙ. මේ ගැන කථිකයා කියන දේ තම තමන්ගෙ රුචි අරුචිකම් අනුව විග්‍රහ කරගන්න ඒ අයට පුලුවන්. ඒත් සබුද්ධිකව ඇහුම්කන් දුන්න අය දන්නව මොනාද කිව්වෙ මොනාද නොකිව්වෙ කියල. කිව් දේ කතාවට අදාලද නැද්ද කියල. ඉසේ කෙස් ගාණට කතා පවත්වලා තියෙන රත්න ශ්‍රී ලට උපුල් ශාන්ත සන්නස්ගලලට කතා පවත්වන හැටි කියා දෙන්න මේ පැගිරි නැට්ටන්ට පුලුවන්ද?

මේ වගේ බොරු සුවරිතවාදීන් අපි මෙල්බන් වලදි ඕනෙ තරම් දැකලා තියෙනවා. උදේ හවා ටෙලිවිෂන් එකේ මිනිස්සු ගෑනු කිස් කරන එක විතරක් නෙවයෙ බුදියන හැටිත් දකින බලන මේ මිනිස්සු සිංහල චිත්‍රපටියක යාන්තම් කිස් කරන සීන් එකක් දැක්කම ලෝක විනාසයක් වුණා වගේ "අර බලන්නෙකෝ අරකේ කිස් කරනවානෙ" කියලා බෙරිහන් දෙන හැටි අපි අහලා තියෙනවා. අනේ බෝ ගස් වගේ. සුපිරි සුපිරිසුදු පුදුම සුවරිතවාදීන්.

මං නං තේරුම් ගත්ත දෙයක් තියෙනවා. මෙල්බන් වල තමන් හරිම ධාර්මිකයි කියලා ලෝකෙට පෙන්නන්න හදන බණ කාරයන් ඉන්නවා නේද? උන් තමයි අමුම අමු කුහක මිනිස්සු. තරහ ගන්ඩ ඒපා දොරේලා. ඒක තමයි කවුරුත් නොකියන ඇත්ත. කවුරු හරි ඒක නෑ කියලා කියන්ඩ එනවා නම් වාදයකට

උහන් වූටි මල්ලි සූදානම්. සාක්කි සහිතව ඔප්පු කරලා පෙන්නන්ඩ පුලුවන් මේ කුහකයන්ගෙ කුහක වැඩ.

තරුණ කලාකරුවන් තුන්දෙනෙක් අතින් වියදම් කරගෙන නොමිලේ කළ උත්සවයකට ඇවිත් ඒ අයගෙ සංග්‍රහත් භුක්ති විඳලා ගිහිල්ලා මේ කළ දේ නම් කැතම කැතයි සහෝ. කුපීතයි.

ලෝකෙට පේන්න කලාකාරයින් විදිටම පෙනී හිටින්ඩ උත්සාහ කරන මේ කලා මුදලාලිලා තමන්ගෙ කුහක වත මේ විදිහට තමන්ම ප්‍රදර්ශනය කරන හැටි එක අතකින් හොඳ දෙයක්. මිනිස්සු ඒකෙන් දැනගන්නවා මේ උන්දැලගෙ තරම. අර රත්න ශ්‍රී කිව්ව ව්‍යාජ කලාකාරයෝ තමයි මේ ඉන්නෙ. කවුරු හරි මහන්සි වෙලා හොඳ වැඩක් කරනකොට ඒකට අබමල් රේණුවක් තරමින් වත් උදව්වක් නොකර ඉඳලා අන්තිමේ අර හොඳ වැඩේට මඩ පාරක් විසි කරන්න හදන මේ කුහක කලා මුදලාලිලා ගැන සමාජය හොඳට දන්නවා. දොරේ හඬත් පඩේ හඬත් මිනිස්සු හොඳට අඳුනනවා. ඔහොම යං. ඔහොම යං.

එස්බීඑස් ගැන ආයෙමත්

දැන් මෙල්බන් වල වැඩ කරන ජනතාවගෙන් ගොඩක් දෙනෙක් එස්බීඑස් සිංහල සේවයට සවන් දෙන බව තේරෙන්නෙ සමාජයේ සැරි සරණ විටයි. ඒක ඉතින් එස්බීඑස් කරන කට්ටියට ලොකු ආඩම්බරයක් තමයි.

වැඩේ තියෙන්නෙ කොච්චර බහුතරයක් ඇහුවත් අවුල තියෙන්නෙ මිනිස්සු තමන්ගෙ වටා ගොනු වෙන්න ගොනුවෙන් මිනිස්සුන්ට තමන් කරන දේ

මොකක්ද කියලා අමතක වෙන එකයි. කවුරු හරි මොකක් හරි සද්භාවයෙන් පෙන්වා දුන්නම අඩු පාඩුව නිවැරදි කරගන්න සූදානම් වෙන්නෙ නැහැ.

කියන එකා මොනවා හරි කව්වම ඒක ඒ මිනිහගේ අදහසක් විතරයි කියලා නොහිතා ඒක මතයක් ලෙස පිළිගන්නැති එක බරපතල අඩුපාඩුවක්.

උදාහරණයක් විදියට සිංහල සේවයේ ප්‍රවෘත්ති බලන්න. මෙරටේ එක එක ජන කොට්ඨාශ අනුව මේ ගුවන් විදුලිය බෙදල දීල තියෙන්නෙ තම තමන්ගෙ සංස්කෘතිය අනන්‍යතාව වර්ධනය කරගන්න කියලයි මම හිතන්නෙ. ඒවට තමයි මූලිකත්වය දෙන්න ඕනෙ. මිනිස්සුන්ට අවශ්‍ය අපක්ෂපාතී ප්‍රවෘත්ති අහන්නයි. ඒකෙදි තමන්ගෙ රටේ ප්‍රවෘත්ති අහන්න තමයි මිනිස්සු බලාපොරොත්තුවෙන්නෙ. මේ ඕස්ට්‍රේලියාවේ රේඩියෝ චැනල් 50ක් විතර තියෙනවා. ඒ චැනල් වල පැය කාලෙන් කාලෙට බාගෙන් බාගෙට මේ රටේ ප්‍රවෘත්ති යනවා. එහෙම තියෙද්දි අපට තිබෙන ප්‍රංචි කාලයේ දි ඔස්ට්‍රේලියාවෙ ප්‍රවෘත්ති කියලා ඒ කාලය නාස්ති කරන එක අපරාධයක්. අපි තිස්ස දෙවේලෙ අහන ප්‍රවෘත්ති පුන පුනා අහනවට වඩා අපේ රටේ වන දෙයක් දැනගන්න මිනිස්සු කැමතියි.

මේ වගේ අදහස් ගණන් ගන්නෙ නැතුව ඉන්නෙ නැතුව පොඩ්ඩක් හිතට ගන්න කියලයි මම කියන්නෙ. මේක මගේ විතරක් අදහසක් නෙවෙයි. හුඟක් අය කියන අදහසක් කියන එකත් දිල්රුක්ෂි අක්කා හිතට ගන්නවා නම් නියමයි. අපි මේව කියන්නෙ ආදරේට කියලත් හිතන්න.

වූටි මල්ලි

NAATI Translator
Sinhalese/English
සිංහල ඉංග්‍රීසි පරිවර්තන සහ
අනෙකුත් ලියකියවිලි කටයුතු

Nadie Kammallaweera
Tel : 0469 879 701
Email: nadiekammallaweera@gmail.com